# වාර්ෂික වාර්තාව
# 2008



## උද්භිද උද්‍යාන භාර අරමුදල

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

# ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුබ සාධනය සඳහා භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2008 (Annual Report – 2008)

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා ශුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 1995-12-15 දිනැති සංදේශය සලකා බලා 1996-02-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ ශුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා ශුභ සාධනය සඳහා භාර අරමුදලට ආදායම වශයෙන් වෙන් කරනු ලබන අතර, මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය එය වේ. ඊට අමතරව අරමුදල ආදායම වැඩිකර ගැනීම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනීමට ඉඩකඩ සලසා ඇත.

### උද්භිද උද්‍යාන භාර අරමුදල

1. අරමුදලේ නම : ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුබ සාධනය සඳහා භාර අරමුදල
2. ස්වභාවය : උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මුල්‍ය සහාය ලබාදීම.
3. අදාල චක්‍රලේඛයන් : I) අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව
   II) ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය
4. ආරම්භ කළ දිනය : 1996 දෙසැම්බර් 20
5. කාර්යාලය : පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය
6. බැංකුව : පේරාදෙණිය ලංකා බැංකුව ගිණුම් අංක 7040848

## 7. අරමුදලේ පරමාර්ථ :

අ) ශ්‍රී ලංකාව හා විදේශ රටවල් තුළ උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තවදුරටත් යහපත් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම

ආ) පාරිසරික අධ්‍යාපනික හා ශාක පිළිබඳව දැනට පවත්නා සංරක්ෂණය සම්බන්ධයෙන් අර්ථාන්විත වැඩ සටහන් ක්‍රියාත්මක කොට දියත් කිරීම

ඇ) උද්භිද උද්‍යානයන්හි සේවා නියුක්ත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම අදාල කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට මූල්‍යමය ආධාර සැපයීම

ඈ) ශාක එකතුව පිළිබවඳව වර්ධනාත්මක වැඩ පිළිවෙලක් ඇති කිරීම

ඉ) උද්භිද උද්‍යානයන්හි ප්‍රයෝජනය සඳහා පාරිසරික අධ්‍යාපනික සංරක්ෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කාර්මික ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරකම් වර්ධනය කිරීම හා ඊට ආධාර කිරීම

ඊ) විද්‍යාඥයින්ට හා උද්භිද උද්‍යානයට පැමිණෙන අයට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය ඕනෑම හදිසි ඉදි කිරීමේ කටයුත්තක් භාර ගැනීම

උ) විශේෂිත වැඩ සටහනකදී පුනරාවර්තන අරමුදල් හිගය පියවා ගැනීම

2008 වර්ෂයේ අරමුදලේ මූල්‍ය තත්වය

| | | |
|---|---|---|
| 2008-01-01 දිනට ආරම්භක බැර ශේෂය | = | රු. 53,736,135.54 |
| එකතු කළා: | | |
| 2008 වර්ෂයේ ආදායම (බැර කිරීම්) | = | රු. 23,582,666.00 |
| | | ----------------- |
| උප එකතුව | = | රු. 77,318,801.54 |
| අඩු කළා : | | |
| 2008 වර්ෂයේ වියදම (හර කිරීම්) | = | රු. 36,517,441.25 |
| | | ----------------- |
| 2008-12-31 දිනට ශේෂය (බැර) | = | රු. 40,801,360.29 |
| | | ========== |

## අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2008 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්

- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය තුළ ඉදි කරන ලද නව ගොඩනැගිල්ලේ පිහිටුවා ඇති අධ්‍යාපන හා පුහුණු අංශයට අවශ්‍ය ලී බඩු උපකරණ හා පරිගණක අරමුදල යටතේ රු.මි. 2.3 ක වියදමක් දරා සපයාගෙන ඇත.



ලබා ගන්නා ලද පරිගණක පාවිච්චි කරමින් පුහුණුව ලබන සිසුන්

- අරමුදල යටතේ රු.මි. 5.3ක මුදලක් වියදම් කර ගම්පහ උද්භිද උද්‍යානයට අලුතින් අත්පත් කරගත් ඉඩම සංවර්ධනය, ජලාශය ඉදි කිරීම් කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින්ද, පහන් කණු සිටුවීම රජයේ කර්මාන්ත ශාලාව මගින්ද, බෝට්ටු අංගනය ඉදි කිරිම ස.ණ.ස. සංවර්ධන සමාගම මගින්ද මෙම වසර තුළ ඉටු කරවාගෙන ඇත.



ගම්පහ උද්භිද උද්‍යානයේ නව සංවර්ධන කොටසට ඇතුළුවීම සඳහා යොදා ගනු ලබන බෝට්ටුව



ගම්පහ උද්භිද උද්‍යානයේ නව සංවර්ධන කොටසේ ඉදිකරනලද ජලාශය හා එහි බොට්ටු පදිමින් විනෝදවන කුඩා ළමුන් පිරිසක්



වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහය ඇතිව ගම්පහ උද්භිද උද්‍යානයේ ඉදි කරන ලද ජලාශය ඈතට දිස්වන අයුරු

- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ සිට මහවැලි ගඟ හරහා වැටී ඇති එල්ලෙන පාලම වසර ගණනාවක් අබලන්ව පැවතීම නිසා සංචාරකයන්ට එම පාලම භාවිතා කිරීමට අවසර නොදෙන ලදි. විවිධ ප්‍රසම්පාදන ක්‍රියාවලි අනුගමනය කරමින් මෙම පාලම අලුත්වැඩියා කිරීමට උත්සාහ කළ නමුත් නිසියාකාරව සිදු නොවූ හෙයින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් මෙම වසරේදී එම කාර්යය ඉටු කරවා ගන්නා ලදි. ඒ සඳහා අරමුදල යටතේ රු.මි. 5.1 ක වියදමක් දරා ඇත.





අළුත්වැඩියා කරන ලද එල්ලෙන පාලම

- ගනේවත්ත වන ඖෂධ උද්‍යානය භාර නිලධාරි සඳහා නිල නිවාසයක් නොමැතිකමින් එම උද්‍යානය නිසි පරිදි පවත්වාගෙන යාමේ දුෂ්කරතාවය පැන නැගී තිබිණ. මෙසේ හෙයින් අරමුදල යටතේ රු.මි. 6.2ක් වියදම් කර වයඹ පළාත් ඉංජිනේරු මගින් නිල නිවාසයක් ඉදි කරවා ගන්නා ලදි.



ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ කාර්යභාර නිළධාරි නිල නිවස

- අලුතින් ආරම්භ කරන ලද අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ ආරම්භක කටයුතු සඳහා ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා අරමුදල යටතේ මුදල් යොදවාගෙන පොලිතින් ගෘහ දෙකක් ඉදි කිරීම මෙම වසරේ ආරම්භ කරන ලදි. මේ සඳහා හංවැල්ල ප්‍රාදේශිය ලේකම් ගේ සහාය ලබාගන්නා ලදි. මෙම වසර තුල ආරම්භ වියදම් සඳහා රු.මි. 1.8 ක වියදමක් දරා ඇත.



අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ පොලිතින් ගෘහ ඉදි කිරීම ආරම්භක අවධිය

- අරමුදල යටතේ රු.මි. 6.6ක වියදමක් දරමින් හක්ගල හා පේරාදෙණිය උද්භිද උද්‍යානවල නිල නිවාස හා කම්කරු නිවාසවල අත්‍යාවශ්‍ය හා හදිසි අලුත්වැඩියා මධ්‍යම පළාත් ගොඩනැගිලි ඉංජිනේරු මගින් ඉටු කරවා ගැනීමට කටයුතු කර ඇත.

**අරමුදල යටතේ කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන් සඳහා වැයකරන ලද මුදල් පිළිබඳ විස්තරය**

| කාර්යය | වියදම |
|---|---|
| 1. අධ්‍යාපන පුහුණු අංශයට ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 1,288,988.00 |
| 2. පේරාදෙණිය උද්‍යානයේ වැසිකිලි ඉදිකිරීම | 1,648,260.00 |
| 3. අධ්‍යාපන පුහුණු අංශයට පරිගණක මිලදී ගැනීම | 1,116,337.00 |
| 4. ගම්පහ උද්‍යාන සංවර්ධනය | 5,340,500.00 |
| 5. පැල රෝපණ ද්‍රව්‍ය මිල දී ගැනීම | 61,975.00 |
| 6. පොත් මිල දී ගැනීම/මාර්ගෝපදේශ පත්‍රිකා මුද්‍රණය | 196,290.00 |
| 7 පුහුණු වැඩ සටහන් | 1,317,612.00 |
| 8. අවිස්සාවේල්ල උද්‍යානය සංවර්ධනය | 2,134,685.00 |
| 9. පේරාදෙණිය උද්‍යානයේ කැෆටේරියා ආපන ශාලාව වැඩිදියුණු කිරීම | 1,786,466.00 |
| 10. හක්ගල කම්කරු නිවාස සංවර්ධනය | 2,935,000.00 |
| 11. පේරාදෙණිය ජල ටැංකිය ඉදිකිරීම | 1,000,000.00 |
| 12. පේරාදෙණිය ආරක්ෂක බැම්ම ඉදි කිරීම | 2,700,000.00 |
| 13. පේරාදෙණිය එල්ලෙන පාලම අලුත්වැඩියාව | 5,179,569.00 |
| 14. ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ ඉදිකිරීම් | 6,290,000.00 |
| 15. හක්ගල රටගාල සංවර්ධනය | 332,550.00 |

එස්. ලියනගම
සභාපති, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ ලේකම්
ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය

එස්. ලියනගම
ලේකම්
ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය
7 ඒ. රීඩ් මාවත, කොළඹ 07.

ආචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර
ලේකම්, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.